© [සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 2022/2025
## පළමු මට්ටම සෙමෙස්තරය I පරීක්ෂණය - 2024

| BD5151 | සිංහල භාෂාවේ ව්‍යාකරණ හා ව්‍යවහාරය<br>Grammar and Practice in Sinhala Language |
|---|---|

මූලාකෘති ප්‍රශ්න පත්‍රය  කාලය : පැය තුනයි

*උපදෙස් :-*

- I කොටසේ ප්‍රශ්න **සියල්ලට ම** මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසින් ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
- I කොටසේ පිළිතුරු පත්‍රය, II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
- II කොටසේ සෑම පිළිතුරක් ම නව පිටුවකින් අරඹන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.

---

විභාග අංකය : ……………………..

### I කොටස

- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න.

01. පහත දැක්වෙන්නේ සිංහල අක්ෂර මාලාව සහ පිළි සම්බන්ධව පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මතු වූ ගැටලු කිහිපයකි. එම ගැටලු සඳහා ඔබේ පිළිතුර ලියා දක්වන්න.

(i) නූතන සිංහල අක්ෂර මාලාවේ ප්‍රධාන ප්‍රභේද **දෙක** කුමක් ද?

(1) ……………………………………………… (2) ………………………………………………

(ලකුණු 01යි)

(ii) ග, ජ, ඩ, ද, ඹ යන අක්ෂර පොදුවේ හඳුන්වන නම කුමක් ද?

……………………………………………………………………………………

(ලකුණු 01යි)

(iii) අල්පප්‍රාණ හා මහාප්‍රාණ අක්ෂර මොනවා ද?

අල්පප්‍රාණ අක්ෂර : ……………………………………………………

මහාප්‍රාණ අක්ෂර : ……………………………………………………

(ලකුණු 01යි)

(iv) 'ගෞරවය' යන වචනයේ ඇතුළත් පිල්ලම් මොනවා ද?

……………………………………………………………………………………

(ලකුණු 01යි)

*2 පිටුව බලන්න*

(v) අන්තඃස්ථාක්ෂර කීය ද? ඒ මොනවා ද?

..............................................................................................................................................

..............................................................................................................................................

(ලකුණු 01යි)

02. භාෂාව නිවැරදි ව සහ නිර්මාණශීලී ව භාවිත කිරීම සඳහා විවිධ පද භාවිතය පිළිබඳ පවතින අවබෝධය වැදගත් වේ. පහත පද වර්ග හඳුනාගෙන පිළිතුර තිත් ඉරි මත සටහන් කරන්න.

(i) ගුරුවරු සිසුන් සමඟ චාරිකාවක් ගියෝ ය. මෙම වාක්‍යයේ ඇතුළත් නිපාත මොනවා ද?

..............................................................................................................................................

(ලකුණු 01යි)

(ii) පිරිසිදු සුමිහිරි ආහාර ගතට
පරසිඳු උපදෙස් ගමු අපි සිතට

මෙම කවි පද දෙකේ ඇතුළත් උපසර්ග මොනවා ද?

..............................................................................................................................................

(ලකුණු 01යි)

(iii) 'ඔහු ගයන ගීය අසන කාගේත් සිත් සතුටට පත් කරයි'. මෙම වාක්‍යයේ ඇතුළත් කෘදන්ත මොනවා ද?

..............................................................................................................................................

(ලකුණු 01යි)

(iv) 'අපි මල්පහන් පුදා තෙරුවන් නමදිමු'. මෙම වාක්‍යයේ ඇතුළත් සමාස මොනවා ද?

..............................................................................................................................................

(ලකුණු 01යි)

(v) 'ගුරුතුමිය ඔසරියකින් සැරසී පොත් බෑගය ගෙන පාසලට පා නගන්නී ය'. මෙම වාක්‍යයේ ඇතුළත් පූර්ව ක්‍රියා පද මොනවා ද?

..............................................................................................................................................

(ලකුණු 01යි)

***සටහන :***

- මෙම ප්‍රශ්න පත්‍රයේ I කොටස ඉහත ආකාරයේ ප්‍රශ්න අටකින් සමන්විත වේ.
- I කොටසෙහි සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු 05 බැගින් ප්‍රශ්න අට සඳහා ලකුණු 40ක් හිමි වේ. (ලකුණු 05 × 8 = ලකුණු 40යි)

* *

*3 පිටුව බලන්න*

© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

**ජාතික අධ්‍යාපන ආයතනය**
**විභාග දෙපාර්තමේන්තුව**
**தேசிய கல்வி நிறுவகம்**
**பரீட்சைகள் துறை**
**NATIONAL INSTITUTE OF EDUCATION**
**DEPARTMENT OF EXAMINATIONS**

**අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 2022/2025**
**පළමු මට්ටම සෙමෙස්තරය I පරීක්ෂණය - 2024**

| | |
|---|---|
| **BD5151** | **සිංහල භාෂාවේ ව්‍යාකරණ හා ව්‍යවහාරය**<br>**Grammar and Practice in Sinhala Language** |

මූලාකෘති ප්‍රශ්න පත්‍රය

## II කොටස

- ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

01. පහත දැක්වෙන ඡේදය අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ක්‍රි. වර්ෂ 1796 දී ඕලන්දයින් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පිහිටි කොළඹ බලකොටුවෙන් එළවා දැමීමෙන් පසු බ්‍රිතාන්‍ය ජාතිකයෝ නගරයෙහි වාඩිලා ගත්හ.

1796 බ්‍රිතාන්‍ය ජාතිකයන් මුහුදුබඩ ප්‍රදේශ අල්ලාගත් පසු ඇඳි ප්‍රථම සිතියම කොළඹ කඩවත් සතර නිරූපණය සඳහා අඳින ලද්දකි. වර්ෂ 1822 ශ්‍රී ලංකාවේ මිනුම්පති ලෙස පත් වූ ජී. ස්නයිඩර් මහතා විසින් 1802 දී ඒ සිතියම සඳහා මිනුම් කටයුතු කරන ලදි. එය බ්‍රිතාන්‍ය යුගයේ දී කරන ලද මැනීම් අනුව අඳින ලද කොළඹ පිළිබඳ ආදිතම සිතියම ලෙස සැලකිය හැකි ය. එහි අරමුණ වී ඇත්තේ කොළඹ අවට කුරුඳු වතු, පොල් වතු, වගුරු සහ ජල මාර්ග පෙන්වා දීම ය. කොළඹ ප්‍රදේශයේ මහාමාර්ග ක්‍රමයේ ආරම්භය සහ එහි ව්‍යාප්තිය පිළිබඳ මනා අවබෝධයක් ඒ සිතියමින් ලැබේ. නගර සීමා දැක්වෙන ඒ සිතියම, කෝට්ටේ විල සම්බන්ධ කරමින් උතුරේ පිහිටි කැළණි ගඟ දක්වා විහිදී යන ඇළ මාර්ගවලින් මායිම් වූ ද බටහිරින් වැල්ලවත්ත ග්‍රාමය දක්වා මුහුදින් මායිම් වූ ද නගර සීමා විදහා දක්වයි.

බ්‍රිතාන්‍ය යුගයේ ප්‍රථම වරට කොළඹ වරාය නිරූපණය කරන සිතියම ඇඳ ඇත්තේ රොබට් පර්සිවල් විසින් වර්ෂ 1803 දී ය. එහි කොළඹ වරාය කෙරෙහි අවධානය යොමු කර ඇති අතර ඒ අවට මුහුදේ ගැඹුරු ස්ථානවල ප්‍රමාණය සහ සුලුප්පු මාර්ග ද පැහැදිලි ව දක්වා ඇත. වරාය අවට ගොඩනැගිලිවල බිම් සැලැස්ම ද එමගින් නිරූපිත ය.

ජේම්ස් කෝඩිනර් පූජකතුමා විසින් 1807 දී අඳින ලද කොළඹ සැලැස්ම දක්වන සිතියමින් නගරය අසලින් ගලා යන කැළණි ගඟ, මුහුද කරා දඟර ගසමින් ගලා යන අයුරුත් නගරයේ මාර්ග විහිදීමත්

4 පිටුව බලන්න

පෙන්වා දෙයි. බ්‍රිතාන්‍ය යුගයේ ආරම්භක සමයෙහි කොළඹ නගරයේ ප්‍රධාන මාර්ග විහිදී ඇති ආකාරයත් ඒ මාර්ග අවට ජනයා පදිංචි වී ඇති සැටිත් කොළඹ අවට ප්‍රදේශයේ කුරුඳු වතු ව්‍යාප්ත වී ඇති අයුරුත් ඉන් මනා ව පෙන්නුම් කරයි.

(i) බ්‍රිතාන්‍යයන් සකස් කළ ප්‍රථම සිතියමින් නිරූපණය වන්නේ කුමක් ද? (ලකුණු 01යි)

(ii) ප්‍රථම සිතියම සඳහා මිනුම් කටයුතු සිදු කළේ කවුරුන් විසින් ද? (ලකුණු 01යි)

(iii) ප්‍රථම සිතියමින් කොළඹ ප්‍රදේශය පිළිබඳ අධ්‍යයනය කළ හැකි තොරතුරු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iv) කොළඹ වරාය නිරූපණය කෙරෙන සිතියමින් හඳුනාගත හැකි තොරතුරු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(v) 1807 දී සකස් කළ කොළඹ සැලැස්ම දක්වන සිතියමින් නිරූපණය කෙරෙන තොරතුරු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)

(vi) මෙම ඡේදයේ සඳහන් කර ඇති ආකාරයට කොළඹ නගරයේ කුරුඳු වතුවල ව්‍යාප්තිය අධ්‍යයනය කළ හැකි සිතියම් මොනවා ද? (ලකුණු 02යි)

02. පහත දැක්වෙන මාතෘකාවලින් **එකක්** තෝරාගෙන වචන 400ක පමණ විශ්ලේෂණාත්මක රචනාවක් ලියන්න.

(i) ලාංකේය අධ්‍යාපනය ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් කරා පරිවර්තනය කිරීමේ අවශ්‍යතාව

(ii) විචාරශීලී, මෘදු කුසලතා සහිත පුරවැසියන් බිහි කිරීමෙහිලා සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය ඉගෙනීමේ වැදගත්කම

(iii) නව ගෝලීය සහ තාක්ෂණික ප්‍රවණතා හමුවේ අහිමි වී යන ළමා ලෝකය සහ එහි ප්‍රතිවිපාක

(iv) සමාජ ජාලා වෙබ් අඩවි මගින් සමාජ, සංස්කෘතික, ආර්ථික, දේශපාලනමය වශයෙන් ජනමතයට සහ ජන රුචිකත්වයට සිදු කරන බලපෑම

(v) ළමා සාහිත්‍ය නිර්මාණකරණයට පාසල් විෂයමාලාව තුළ අවස්ථාව ලබා දීමේ වැදගත්කම

(ලකුණු 15යි)

***සටහන :***

- මෙම පත්‍රයේ II කොටස ඉහත ආකාරයේ ප්‍රශ්න හයකින් සමන්විත වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- සෑම ප්‍රශ්නයක් සඳහා ම ලකුණු 15 බැගින් හිමි වේ.
- II කොටස සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ප්‍රශ්න හතරක් සඳහා ලකුණු 60ක් හිමි වේ.
  (ලකුණු 15 × 4 = ලකුණු 60යි)

* * *